**නැගෙනහිර විශ්වවිද්‍යාලය - 2020**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**------------------------------**

නැගෙනහිර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාල සටහන් සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

-----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධ විගණකගේ වගකීම

---------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව.

- යම් අදාළ ලිඛිත නීතියකට විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාතමක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් “ මනාලෙස සැපසුම් කරන ලද ” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 50 ඡේදය ප්‍රකාරව එකතු පිරිවැය රු. 104,464,552 ක් වටිනා අනෙකුත් වත්කම් ආයතනයේ මෙහෙයුම් වල සමාන ස්වභාවයක් හෝ ක්‍රියාකාරීත්වයක් ඇති වත්කම් කාණ්ඩගත නොකර දේපල, පිරියත සහ උපකරණ යටතේ දක්වා තිබුණි. | අනෙකුත් වත්කම් වර්ගීකරණය උපලේඛනයේ පිටු අංක 201 හි ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 536,453,179 ක් වූ දේපල, පිරියත හා උපකරණ සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | ප්‍රමිතය අනුව වත්කම ප්‍රත්‍යාගණනය කිරීම සඳහා පියවර ගනු ලබන අතර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා කමිටු පත් කරමින් සිටින බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 43, 45 සහ 72 ඡේද ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ ස්ථාන 11 ක පිහිටි හෙක්ටයාර 210 ක පමණ වූ ඉඩම්හි අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොතිබුණි. | ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය සතු ඉඩමේ හා ගොඩනැගිලි වල හිමිකාරීත්වය ලබාගැනීම හා ප්‍රත්‍යාගණන ක්‍රියාවලිය සිදු වෙමින් පවතින බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------------------- | ------------------------------ | -------------------------- |
| (අ) | කෙටිකාලීන ආයෝජන වලින් ලද රු. 18,894,941 ක් වූ පොලී ආදායම, ආදායමක් ලෙස හඳුනානොගෙන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වගකීම් යටතේ සීමිත අරමුදල් (restricted fund) යටතේ එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල අතිරික්තය රු. 3,198,334 කින් අඩුවෙන් හා සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පොදු සංචිතය සහ සීමිත අරමුදල රු. 18,894,941 කින් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි. | පාලක සභාවේ අනුමැතිය මත අවශ්‍ය පියවර ගනු ලැබේ. | නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය අනුව ගොඩනැගිලි සියයට 5 බැගින් ක්ෂය කළ යුතු වුවද පිරිවැය රු. 3,666,316 ක් වූ ව්‍යාධිවේද රසායනාගාරය (Pathology) සියයට 10 බැගින් ක්ෂය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමුච්චිත ක්ෂය ප්‍රමාණය රු. 1,283,156 කින් වැඩියෙන් මූල්‍ය ප්‍රකශනවල දක්වා තිබුණි. | මේ වන විට නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දක්වා ඇති අගයන් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | බැංකු ගිණුම් 3 ක එකතුව රු. 4,060,132 ක් වූ සෘජු හර කිරීම් මූල්‍ය ප්‍රකාශන වල වියදම් ලෙස හඳුනාගැනීමකින් තොරව බැංකු සැසඳුම් ප්‍රකාශයේ හඳුනානොගත් හර කිරීම් ලෙස දක්වා තිබුණි. | ලේඛකාධිකාරී විසින් පත් කළ කමිටුව අනුව ගණන්දීමේ නිලධාරීගේ සීමාව තුල ශේෂ කපා හැරීම සඳහා අනුමැතිය ලබා ගන්නා බව හා ගණන්දීමේ නිලධාරීගේ අනුමත කිරීමේ සීමාවෙන් පිට ශේෂ කපා හැරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කරන බව. | හඳුනානොගත් හර කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට වසර 3 සිට වසර 38 ක කාලයක් තුළ කථිකාචාර්යවරු 71 දෙනෙකු විසින් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් එකතුව රු. 155,332,578 ක් වූ බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසර 10 ක් ඇතුලත කඩකිරීම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගෙන ඇත. 2020.12.19 දින පැවති රැස්වීමේදී තීරණය වූ පරිදි කොමිෂන් සභා චක්‍රලේඛ අංක 920 ප්‍රකාරව බැඳුම්කර කඩකරන්නන් වෙත එන්තර වාසි යැවීමට තීරණය කරන ලදී. | කථිකාචාර්යවරුන්ගෙන් හෝ නීතිමය පියවර ගැනීම ප්‍රමාද වීමට අදාල වගකිව යුතු නිලධාරීන්ගේන් බැඳුම්කර වටිනාකම අයකර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 වන දිනට වර්ෂ 03 සිට වර්ෂ 15 දක්වා කාලයක සිට පැවතෙන එකතුව රු. 20,839,969 ක් වූ ලැබිය යුතු සේවක ණය හා අත්තිකාරම් සහ එකතුව රු. 84,161,724 ක් වූ බාහිර පාර්ශව | තොරතුරු සොයා ගැනීමට හැකි වූ 2010 න් පසු නිරවුල් නොකළ අත්තිකාරම් නිරවුල් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, තොරතුරු සොයා ගත නොහැකි 2010 වර්ෂයට | සේවකයන්ගෙන් හා බාහිර පාර්ශව වලින් ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| වලින් ලැබිය යුතු මුදල් අයකර ගැනීමකින් තොරව හිඟව පැවතුණි. | පෙර අත්තිකරම් පිළිබඳ COPE කමිටුව වෙතද දන්වා ඇත. ඒ අනුව අදාළ බලධාරීන්ගේ අනුමැතිය සහිතව කපා හැරීමට කටයුතු කරනු ලැබේ. |

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජංගම වගකීම ලෙස වර්ෂ 03 සිට වර්ෂ 15 දක්වා කාලයක සිට පැවතෙමින් තිබූ එකතුව රු. 20,810,414 ක් වූ විවිධ ණය හිමියන් හා අනෙකුත් ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර නොතිබුණි. | වර්ෂ 10 කට වැඩි සමහර ඉදිරියට ගෙන එමින් පවතින ගෙවිය යුතු දෑ සඳහා අප සතුව අදාල ලියකියවිලි නොමැත. කෙසේ වුවද විශ්වවිද්‍යාලය එම මුදල පිළිබඳ ගිණුම් හා පොත් වලින් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති ,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 371 | අග්‍රිම නිකුත් කළ මූල්‍ය වර්ෂයේ දෙසැම්බර් 31දින ට පෙර නිරවුල් කිරීම හෝ ආපසු ගෙවීම කළ යුතු වුවද 2002 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා කාලය තුළ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ 10 දෙනෙකු සඳහා ලබා දී තිබූ එකතුව රු. 994,306 ක් වූ අත්තිකාරම් මුදල් 2021 ජූනි 23 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 19 වැනි දින පාලක සභාවේ තීරණය පරිදි අදාළ නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගැනීමට ක්‍රියා කරමින් ඇත. කිසියම් නිලධාරියකු විසින් කලින් පියවීම් කර ඇති බවට කිසියම් ලේඛනමය සාක්ෂියක් ඇත්නම් ඔවුන්ගේ නම් ලේඛනවලින් ඉවත් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි වලට අනුව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය | | . | |

| | | | |
|---|---|---|---|
| (i) VII පරිච්ඡේදයේ 02 (XV) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වැනි වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | එකතුව රු. 104,088,440 ක් වූ ආයෝජනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ එකඟතාව සහ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘතියට අනුව ආයෝජන ලේඛනය පවත්වාගෙන ගොස් නොතිබුණි. | සියළුම ආයෝජන සඳහා මුදල් කමිටුවේ නිර්දේශ හා අනුමැතිය මත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වැනි වගන්තිය සහ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය අනුව සිදු කරනු ලැබේ. | අදාළ චක්‍රලේඛවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) XX පරිච්ඡේදයේ 3(1) වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ලිපි | සියලුම කාර්ය මණ්ඩලය ඇඟිලි සලකුණු යන්ත්‍රයේ ඔවුන්ගේ පැමිණීම් සහ පිටවීම් ඇතුළත් කළ යුතුය. එසේ වුවද අධ්‍යයන කාර්ය මණ්ඩලය ඒ අනුව කටයුතු කරනු නොලැබේ. | සම්ප්‍රදායට අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය අනෙකුත් සියලුම විශ්වවිද්‍යාලවල මෙන් ඔවුන්ගේ පැමිණීම සටහන් කරනු නොලැබේ. කෙසේ වෙතත් අදාල දෙපාර්තමේන්තු වල තම තමන්ගේ පැමිණීමේ ලේඛනයේ පැමිණීම අත්සන් කර ඇත. | පැමිණීම හා පිටවීම ඇතුළත් කිරීමට පියවර ගත යුතුය. |
| (iii) 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන ආයතන චක්‍රලේඛ ලිපිය මගින් සංශෝධිත XXVI පරිච්ඡේදයේ 3 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්විය යුතු අතර එහි වාර්තාව 2021 මාර්තු 17 හෝ ඊට පෙර විගණකාධිපති වෙත ලබා දී තිබිය යුතුය. කෙසේ වෙතත් එවැනි වාර්තාවක් 2021 ජූනි 21 දින දක්වා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. තවද 2019 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව වටිනාකම රු. 1,379,602 ක් වූ වට්ටෝරු භාණ්ඩ අයිතම 139 ක ඌනතාවය සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ කටයුතු නියමිත වේලාවට අවසන් කර ඇත. කෙසේ වෙතත් COVID වසංගතය හේතුවෙන් අවසන් කිරීම ප්‍රමාද වූ අතර එය ඉදිරි සතියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. මෙම ඌනතා නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතියි. | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) 2016 දෙසැම්බර් 22 දිනැති අංක 2004/LD/1 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මණ්ඩලයේ චක්‍රලේඛය | පුස්තකාල පොත්වල වාර්ෂික තොග සත්‍යාපනය විශ්වවිද්‍යාලය ආරම්භයේ සිටම සිදුකර නොතිබුණි. | පුස්තකාලයේ දැනට පොත් සහ වාර සඟරා 98,000 කට ආසන්න ප්‍රමාණයක් ඇත. පොත් සත්‍යාපනය කිරීමේ ක්‍රියාවලිය වසර 3 කට පෙර ආරම්භ කල නමුත් මෙම කාර්යය සම්පූර්ණ කිරීමට බොහෝ බාධා ඇති විය. සාමාන්‍ය තත්ත්වයට පත් වුවහොත් ඉතිරි කටයුතු කඩිනම් කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 291,444,058 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 576,266,345 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.284,822,287 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනය සඳහා ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් රු. 213,733,657 කින් අඩුවීම හා ගිවිසුම්ගත සේවා වියදම් රු. 30,629,921 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය අවසානයට විශ්වවිද්‍යාලයේ ජංගම වත්කම් වල වටිනාකම රු. 1,259,560,040 ක් වූ අතර ජංගම වගකීම් වල වටිනාකම රු. 132,674,003 ක් විය. ඒ අනුව එහි සම්මත අනුපාතය 2:1 ක් වුවද ජංගම අනුපාතය 9:1 ක් විය. මේ අනුව විශ්වවිද්‍යාලයේ සෑම ජංගම වගකීම් රු. 1 කට ජංගම වත්කම් රු. 9 ක් පැවතුණු අතර ජංගම අනුපාත සම්මත ආවරණය වූ 2 වරක් වෙනුවට 9 වරක් ආවරණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂය තුල ත්‍රිකුණාමලය මණ්ඩපය REPO තැන්පතු මඟින් රු. 2,164,630 ක අතිරේක ආදායමක් උපයාගෙන තිබුණි. එසේ වුවද මණ්ඩපය විසින් REPO තැන්පතුවල ආයෝජනය කිරීමේ හැකියාවක් තිබුණද, අතිරේක ආදායමක් උපයා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුල හා විගණිත දිනය දක්වාම කළමනාකරණය විසින් උත්සහයක් ගෙන නොතිබුණි. | 2020 වර්ෂය තුල භාණ්ඩාගාර ප්‍රදාන 2020 පෙබරවාරි මාසයේදී ලැබුණු අතර එම ප්‍රදානයන්ගෙන් බිල්පත් ගෙවන ලදී. එසේම කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි සිදු නොවූ අතර භාණ්ඩාගාරය සාමාන්‍ය පරිදි අරමුදල් නිදහස් කිරීමද සිදු නොවීය. එම නිසා, over night තැන්පතු අඛණ්ඩව සිදු කිරීමට නොහැකි විය. කෙසේ වුවද ඉදිරියේදී අරමුදල් ලබාගැනීමේ හැකියාව අනුව REPO ආයෝජනය සඳහා කටයුතු කරනු ලැබේ. | අරමුදල් පවතින තත්ත්වය මත REPO තැන්පතු මඟින් අතිරේක ආදායමක් ලබා ගැනීමට කටයුතු කල යුතුය. |

**3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශකවරුන්ට අධ්‍යයන දීමනා ගෙවීමේදී අපේක්ෂිත අරමුණු සැලකිල්ලට නොගෙන 1988 ජූලි 13 දිනැති අංක 21/88 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පදනම් කරගෙන ත්‍රස්තවාදී ප්‍රචණ්ඩත්වය හේතුවෙන් මියගිය දේශකවරයකුගේ යැපෙන්නන් සඳහා 2004 වර්ෂයේ සිට 2021 ජූනි මාසය දක්වා රු. 10,892,078 ක මුදලක් ගෙවා තිබුණි. | 1988.07.13 දිනැති අංක 21/88 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා පසුව කරන ලද සංශෝධන අනුව, මියගිය සේවකයින්ගේ යැපෙන්නන්ට ඔහුගේ විශ්‍රාම වයස එළඹෙන තුරු ඔහුට ලැබිය යුතු වැටුප සහ අනෙකුත් දීමනා ගෙවිය යුතුය. ඉහත විධිවිධානවලට අනුව 2004 වසරේදී මියගිය සේවකයාගේ යැපෙන්නන් හට වැටුප් හා දීමනා ගෙවන ලදී. | අධ්‍යයන දීමනා ලබාදීමේ අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කල යුතුය. |

**3.3 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත අරමුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නැගෙනහිර විශ්වවිද්‍යාලයේ හා ත්‍රිකුණාමලය මණ්ඩපයේ පැවති රු. 1,336,416 ක් වටිනා වට්ටෝරු භාණ්ඩ පසුගිය වසර 03 තුල භාවිතයට ගැනීමකින් තොරව නිෂ්ක්‍රියව පැවතුණි. | අවශ්‍යතාවය පරිදි නඩත්තු දෙපාර්තමේන්තුව විසින් මෙම භාණ්ඩ භාවිතයට ගනු ලබන අතර චලනය නොවන පාරිභෝජ්‍ය අයිතම සඳහා පත්කල කමිටුවේ නිර්දේශය මත කඩිනම් පියවර ගනු ලැබේ. | වට්ටෝරු භාණ්ඩ භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අනුමත අධ්‍යයන කාර්යමණ්ඩලය 285 ක් වූ අතර තත්‍ය අධ්‍යයන කාර්යමණ්ඩලය 218 ක් විය. මේ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 67 ක් වූ අතර, ඉන් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය පුරප්පාඩු සංඛ්‍යාව 15 ක් ව පැවතිණි. අනධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු සංඛ්‍යාව 120 ක් විය. විශ්වවිද්‍යාලය විසින් මේ දක්වා මෙම පුරප්පාඩු පිරවීම සිදු කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය විසින් අවස්ථා ගණනාවකදී අධ්‍යයන තනතුරු සඳහා දැන්වීම් පල කිරීමට කටයුතු කර ඇත. සුදුසු අයදුම්කරුවන් සංඛ්‍යාව සීමිත වීම ගැටළුවක් වී ඇත. අප විසින් බාහිර කථිකාචාර්යවරු බඳවා ගැනීම මගින් නිර්මාණය වී ඇති රික්තය කළමනාකරණය කර ඇත. | ප්‍රමාදයකින් තොරව පුරප්පාඩු පිරවීමට කටයුතු කල යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ වූ අරමුණු 07 කට අදාල අයවැය හා සත්‍ය වියදම අතර සියයට 07 සිට සියයට 309 දක්වා සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය කළමනාකරණ පාලනයේ ඵලදායී මෙවලමක් ලෙස භාවිතා කර නොතිබුණි. | අයවැය සකස් කරන අවස්ථාවල අපේක්ෂා නොකරන ලද තත්ත්වයක් නිසා සහ ප්‍රමුඛතාවය මත හා සත්‍ය අවශ්‍යතාවය මත වියදම් කර ඇත. තවද, 2019 වර්ෂයේ ඇනවුම් කල භාණ්ඩ 2020 වර්ෂයේ ලැබීම නිසා සත්‍ය වියදම වැඩි වීමට බලපා ඇත. | අයවැය විචලතාව අවම කිරීමට අවශ්‍ය පියවර ගතයුතු අතර ප්‍රතිපාදන ඵලදායී ලෙස භාවිතා කල යුතුය. |